# බළන්ගොඩ නගර සභාව

## 2022-06-09 වන දිනැති මහා සභා රැස්වීම් වාර්තාව

**ස්ථානය - බළන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාව**

**දිනය - 2022.06.09**

**වේලාව - පෙ.ව. 10.00**

**බළන්ගොඩ නගර සභාවේ ගරු සභාපති ඩබ්.ඒ. වසන්ත ගුණරත්න මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් මෙදින මහ සභාවේ කටයුතු පවත්වන ලදී.**

**සහභාගීත්වය**

| | |
|---|---|
| 1. ගරු සභාපති | ඩබ්.ඒ. වසන්ත ගුණරත්න මැතිතුමා |
| 2. ගරු උප සභාපති | එම්.ටී.එම්.රුමි මැතිතුමා |
| 3. ගරු නාගරික මන්ත්‍රී | ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා |
| 4. ගරු නාගරික මන්ත්‍රී | චමික ජයමිණි විමලසේන මැතිතුමා |
| 5. ගරු නාගරික මන්ත්‍රී | ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමා |
| 6. ගරු නාගරික මන්ත්‍රී | එම්. ජුනයිදීන් මලික්ෂා මැතිතුමා |
| 7. ගරු නාගරික මන්ත්‍රී | එම්. නිමල් කරුණාරත්න මැතිතුමා |
| 8. ගරු නාගරික මන්ත්‍රී | නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා |
| 9. ගරු නාගරික මන්ත්‍රිනි | ජී. චන්ද්‍රලතා මැතිතුමිය |
| 10. ගරු නාගරික මන්ත්‍රී | එම්.එස්.පී.ගලප්පත්ති මැතිතුමා |
| 11. ගරු නාගරික මන්ත්‍රී | එම්. ඩබ්. විමලසිරි මැතිතුමා |
| 12. ගරු නාගරික මන්ත්‍රී | රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා |
| 13. ගරු නාගරික මන්ත්‍රිනී | පී. කේ. එන්. ටී. ඩී. සමරසේකර මැතිතුමිය |
| 14. ගරු නාගරික මන්ත්‍රිනී | සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය |
| 15. ගරු නාගරික මන්ත්‍රිනි | එම්. ශාන්තිලේඛා මැතිතුමිය |
| 16. ගරු නාගරික මන්ත්‍රී | කේ. ජී. පේමදාස මැතිතුමා |
| 17. ගරු නාගරික මන්ත්‍රිනී | මංගලිකා ඉලංකෝන් මැතිතුමිය |

**නිළධාරි සහභාගීත්වය**

1. ලේකම් ඩී.එම්.ජේ.යූ.ධර්මරත්න මයා

**01. පසුගිය සභාවේ 2022-05-19 දිනැති මහා සභා වාර්තාව හා 2022-06-01 දිනැති විශේෂ මහ සභා වාර්තාව සභා සම්මත කිරීම.**

මෙදින මහ සභාවේ වැඩ කටයුතු ආරම්භ කළ ගරු සභාපතිතුමා, ආගම සිහි කිරීමෙන් අනතුරුව සභාව සඳහා සහභාගි වූ ගරු මන්ත්‍රී මණ්ඩලය, ලේකම්තුමා ඇතුළු කාර්ය මණ්ඩලය හා මාධ්‍යවේදීන් ඇතුළු සියළුදෙනා පිළිගන්නා ලදී.

ඉන් අනතුරුව 2022-05-19 දින පැවති මහ සභාවේ සභා වාර්තාව හා 2022-06-01 දින පැවති විශේෂ මහ සභා වාර්තාව සංශෝධනයන්ට යටත්ව සත්‍යය වාර්තාවක් බවට සභා සම්මත කර ගන්නා ලෙස පවසා සිටින ලදී.

මෙහි දී ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී. වීරසිංහ මැතිතුමා, 2022-05-19 දින පැවති මහ සභාවේ සභා වාර්තාව හා 2022-06-01 දින පැවති විශේෂ මහ සභා වාර්තාව සංශෝධනයන්ට යටත්ව සත්‍යය වාර්තාවක් බවට යෝජනා කළ අතර ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

අනතුරුව ගරු සභාපතිතුමා විසින් මෙදින සභා වාර්තාවේ සංශෝධනයන් තිබේදැයි විමසීය.

මෙහි දී ගරු නාගරික මන්ත්‍රී කේ.ජී. පේමදාස මැතිතුමා, 2022-05-19 මහ සභා වාර්තාවේ (පිටු අංකය 21) මන්ත්‍රී පැහැදිලි කිරීම් යටතේ තමන් විසින් "අනුර කුමාර දිසානායක තම නායකතුමා" ලෙස පැවසූ බවට සඳහන් කර ඇති නමුත් තමන් එවැනි ප්‍රකාශයක් සිදු නොකළ අතර, එය "අනුර කුමාර දිසානායක" ලෙස සංශෝධනය විය යුතු බව පවසන ලදී.

**ඒ අනුව ඉහත සංශෝධනයන්ට යටත්ව 2022-05-19 දින පැවති මහ සභාවේ සභා වාර්තාව හා 2022-06-01 දින පැවති විශේෂ මහ සභා වාර්තාව ගරු සභාවේ සම්මත විය.**

**02. ගරු සභාපතිතුමන් විසින් කරනු ලබන නිවේදන**

- ගරු සභාපතිතුමා නිවේදන වාරය ආරම්භ කරමින් අඩු ආදායම්ලාභී පවුල් සඳහා ඉල්ලුම් පත්‍ර 06 බැගින් ඒ ඒ මන්ත්‍රීවරුන්ට ලබා දී ඇති අතර, එම ඉල්ලුම් පත්‍ර හැකි ඉක්මනින් අදාල නිළධාරීන්ගෙන් සහතික කරගෙන ඉදිරිපත් කරන ලෙස ද හාල්, පරිප්පු, සීනි ආදි ද්‍රව්‍ය ලබා දීමට අපේක්ෂා කළත් පවතින මිල ගණන් අනුව හාල් කිලෝ ග්‍රෑම් 20 බැගින් හෝ ලබා දීමට සිදු වන බව ද පැවසීය.

- එමෙන්ම ගිවිසුම් අත්සන් කළ නමුත් අතර මග නතර කරන ලද සංවර්ධන කටයුතු හැකි ඉක්මනින් අවසන් කරන ලෙස ද තුඹගොඩ සාංඝිකාරාම විහාරස්ථානයේ කාණුව ඉදි කිරීමේ කටයුතු ඉක්මනින්

අවසන් කරන ලෙස ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමාගෙන් ඉල්ලා සිටින බව ද පවසන ලදී.

**03. සංදේශ / පැමිණිලි / පෙත්සම් / ආයාචනා ඉදිරිපත් කිරීම**

- සබරගමුව පළාත් පාලන දෙපාර්තමේන්තුව විසින් පළාත් පාලන ආයතන මහජන නියෝජිතවරයන්ගේ 2021 හා 2022 වර්ෂවලට අදාල වත්කම් හා බැරකම් ප්‍රකාශ ලැබීමට සලස්වන ලෙස දන්වා ලිපියක් එවා ඇති අතර, එම ලිපිය ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදී.

  ඒ අනුව හැකි ඉක්මනින් වත්කම් හා බැරකම් ප්‍රකාශ සම්පූර්ණ කර ලබා දෙන ලෙස ගරු සභාපතිතුමා පැවසීය.

- ස්වයං රැකියාවක් වශයෙන් මල් පෝච්චි සහ පැල වෙළඳාම සිදු කර ගෙන යාමට ප්‍රධාන මාර්ගය අසල ස්ථානයක් නොමැති බැවින් මොහාන් එල්ලාවල මාවතේ දොරවෙල ඔය සහ ප්‍රධාන මාර්ගය අසල ඇති බිම් තීරුවෙන් කොටසක් නගර සභාවේ කොන්දේසි හා අණ පනත් යටතේ බදු පදනම මත ලබා දෙන ලෙස ඉල්ලමින් බළන්ගොඩ, කිරිදිගල, වැලිහරනාව පාර,අංක 35/3 ලිපිනයේ පදිංචි ඒ.කේ.ඒ. නිශ්ශංක පත්ම කුමාර යන අය විසින් කරන ලද ඉල්ලීම් ලිපිය ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදී.

  එමෙන්ම ස්වයං රැකියාවක් වශයෙන් මල් පෝච්චි හා මල් පැළ වෙළඳාම කරගෙන යාමට මෙම ස්ථානයම බදු පදනම මත ලබා දෙන ලෙස බළන්ගොඩ, රාස්සගල පාර, සුදර්ශනපුර, අංක 39 ලිපිනයේ පදිංචි එම්.කේ.ඩී. මුළුතියනගේ යන අය විසින් ද ලිපියක් ඉදිරිපත් කර ඇති බව ගරු සභාපතිතුමා පැවසීය.

  මේ සම්බන්ධව අදහස් දැක් වූ ගරු නාගරික මන්ත්‍රී චමික ජයමිණ විමලසේන මැතිතුමා පැවසූවේ මෙම ඉඩමට නඩුවක් පවතින අතර, පුද්ගලයෙකුට ලබා දීම වෙනුවට සභාවේ කාර්යයක් වෙනුවෙන් යොදා ගැනීම උචිත වන බව හා  අවශ්‍ය නම් විධිමත් පරිදි කල් දී ඇති යෝජනාවක් වශයෙන් ඉදිරිපත් කර තීරණයක් ගැනීම සුදුසු වන බවයි.

  ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්. එන්.ජී. වීරසිංහ මැතිතුමා අදහස් දක්වමින් එම ස්ථානයේ කසළ එක්රැස් වී ඩෙංගු ව්‍යාප්තියකට හේතු වී ඇති අතර, කිසියම් අයකු ස්වයං රැකියාවක් වශයෙන් හෝ මල් පැල හා මල් පෝච්චි වෙළඳාම කරන්නේ නම් එය නගරයට අලංකාරයක් වන බව ද මෙම කාලයේ මිනිසුන් දුෂ්කරතා මැද ජීවත් වන අතර, මේ සම්බන්ධව මානුෂිකව බලා තීරණයක් ගැනීම සුදුසු බව ද සභාවට ඉන් ආදායමක් ලැබෙන බව ද මෙම ඉඩම පොළට පැවති එකක් වන අතර, මාර්ග සංවර්ධන අධිකාරිය අත්පත් කර ගත් පසු රජයකින් වන්දි නොගෙවන බව ද නඩුවෙන් පරාද වූ බව ද යකඩ ගොඩ ඉවත් කිරීම සුදුසු බව ද පවසන ලදී.

  මෙහි දී ගරු නාගරික මන්ත්‍රී තරංගනී සමරසේකර මැතිතුමිය පැවසූවේ නගර සභාවට අයිතිය ඇති කොටසක් නම් මෙම ස්ථානය ටෙන්ඩර් ක්‍රමයකට ලබා දීම සුදුසු වන අතර, එක් පුද්ගලයෙකු තීරණය කර ලබා දීමට තමා විරුද්ධ වන බවයි.

නැවත වරක් අදහස් දක්වූ ගරු නාගරික මන්ත්‍රී චමික ජයමිණි විමලසේන මැතිතුමා, හිටපු සභාපතිතුමා විසින් ඩෙංගු ව්‍යාප්තියට මෙම ස්ථානය බලපා ඇති බව පැවසූ නමුත් මුළු බළන්ගොඩ ප්‍රදේශයේ සෑම ස්ථානයකම ගොස් ටින් බෙලෙක්ක ඇතුළු ද්‍රව්‍ය එක්රැස් කර විධිමත් පරිදි අසුරා විශාල මෙහෙවරක් මෙම යකඩ බඩු එකතු කරන කටයුත්තෙහි නියැලෙන පුද්ගලයා විසින් සිදු කරන අතර, දෛනිකව කුලියට කම්කරුවන් 15-20 ක් පමණ සේවයේ යොදවා ඇති බව ද ඩෙංගු උවදුර තුරන් වීමට මෙය බලපා ඇති බව ද පවසන ලදී.

එමෙන්ම මෙම ඉල්ලීම් ලිපි ඉදිරිපත් කර ඇති පුද්ගලයන් මුදල් දේපල ඇති අය බව ද සභාවේ දිගින් දිගටම සිදු වූයේ මහජන දේපල, පොදු දේපල තම තමන්ගේ පාක්ෂිකයන්ට හා හිතවතුන්ට ලබා දීම බව ද තමන් බලයේ සිටි කාලයේ එය නතර කළ නමුත් මේ වන විට නැවතත් එය ආරම්භ වී ඇති බව ද මහජන දේපල මුදල් කොල්ල කන්නන් ඊලඟ ආත්මයේ දී බල්ලන් කපුටන් වී ඉපදෙන බව ද ජීවත් වීමේ අයිතිය හැමදෙනාගේම සුරක්ෂිත විය යුතු අතර, මේ සම්බන්ධව පුළුල්ව සිතා කටයුතු කරන ලෙස ද අද රටට වී ඇත්තේ මේ දේම බව ද වැඩිදුරටත් පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ. ප්‍රේමකුමාර මැතිතුමා අදහස් දක්වමින් මෙම ස්ථානයේ සිටින පුද්ගලයා ඉවත් නොකර ලබා දීමට හැකි අතර, මෙම ඉල්ලීම කරන ලද එක් අයෙක් තමා හොඳින් දන්නා කෙනෙකු බව ද වත්කමක් නොමැති අතර, ව්‍යාපාර කඩා වැටී බැංකුවට ලක්ෂ 40 ක් පමණ ණය ගෙවීමට සිදු වී ඇති බව ද නිවස වෙන්දේසි කිරීමට සූදානම් කර ඇති අතර කිසිවෙකුට හානියක් නොවන පරිදි හා සභාවට ආදායමක් ලැබෙන පරිදි මෙම ස්ථානය ලබා දීම සුදුසු බව ද පවසන ලදී.

මේ සම්බන්ධව පැවති සාකච්ඡාවේදී මීළඟ මහ සභාවේ කල් දී ඇති යෝජනා යටතේ විධිමත්ව යෝජනාවක් ඉදිරිපත් කර ඉදිරි කටයුතු කිරීම සුදුසු බවට තීරණය විය.

- බළන්ගොඩ, තුඹගොඩ, චෙට්නෝල් පටු මග, අංක 16/20/ඩී ලිපිනයේ පිහිටි නිවස පිටුපස ඉදි කර තිබූ තාප්පය නගර සභාව විසින් අවිධිමත්ව හා අනාරක්ෂිතව ඉදි කර ඇති ජලය බැස යන කාණුව හේතුවෙන් කඩා වැටුණු බවත්, මෙම කාණුව හා තාප්පය ඉදි කිරීම ප්‍රමාද වුවහොත් බරපතල හානියක් සිදු විය හැකි බවත්, මෙම දැන්වීම ලැබී දින 14 ක් ඇතුලත තාප්පය හා කාණුව ආරක්ෂිත ක්‍රමවේදයකට ඉදි කිරීම සඳහා පියවර ගන්නා ලෙසත්, මෙම දැන්වීම ප්‍රකාරව කටයුතු කිරීම පැහැර හරින්නේ නම් මෙකී අනතුරට හා හානියට වග කිව යුතු නගර සභාවේ සියලු නිළධාරීන්ට එරෙහිව නීතිමය පියවර ගන්නා බවට ඉහත ලිපිනයේ පදිංචි ජයන්ත හෙන්දාවිතාරණ මහතා විසින් තමා වෙත උපදෙස් ලබා දී ඇති බවත් පවසමින් නීතිඥ හා ප්‍රසිද්ධ නොතාරිස් දේශබන්දු සූරිය පටබැඳි මහතා විසින් ඉදිරිපත් කරන ලද දැන්වීම ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදී.

ගරු සභාපතිතුමා අදහස් දක්වමින් 2022-05-19 දිනැති මහ සභාවේ 05:01:10 යටතේ හානියට පත් වූ තාප්ප දෙක හා කාණුව ඉදිකිරීම සඳහා සභා අනුමැතිය ලැබුණු නමුත් පළාත් පාලන කොමසාරිස්තුමා මෙය කළ නොහැකි බවට පැවසීමත් සමඟ නතර කළ බව ද මේ සඳහා ලක්ෂ 21 ක් පමණ ඇස්තමේන්තු කර ඇති අතර, තාප්පයන් සඳහා වන ඇස්තමේන්තුවෙන් 30% ක් අදාල තාප්ප

හිමිකරුවන් ලබා දෙන බව ද කැඩී ගිය තාප්පයේ ගල් කියුබ් 20 ක් පමණ තිබෙන බව ද මෙය කඩිනමින් ඉදි නොකළහොත් කෝටි 02 ක් හෝ 03 ක් අදාල හානියන් වෙනුවෙන් ගෙවීමට සිදු වන බව ද පවසන ලදී.

මේ සම්බන්ධයෙන් අදහස් දක්වමින් ගරු උප සභාපතිතුමා පැවසූවේ අපකීර්තියක් හා හානියක් සිදු වන නිසා හැකි ඉක්මනින් මෙම ඉදිකිරීම් සිදු කළ යුතු අතර, පළාත් සභාව විසින් මෙය ඉටු නොකරන ලෙස පවසන්නේ නම් සිදු විය හැකි හානියේ වගකීම පළාත් සභාව විසින් ගත යුතු බවයි.

පළාත් පාලන කොමසාරිස්තුමා හා බළන්ගොඩ නගර සභාව විසින් ගනු ලැබූ ක්‍රියාමාර්ගයන් සම්බන්ධව ලේකම්තුමාගෙන් කරුණු පැහැදිලි කර ගැනීම සඳහා ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් හා ගරු උප සභාපති එම්.ටී.එම්. රූමි මැතිතුමාගේ ස්ථිරත්වයෙන් ගරු සභාව කාරක සභාවක් බවට පත් කරන ලදී.

අදාල කරුණු පැහැදිලි කර ගැනීමෙන් අනතුරුව ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් හා ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමාගේ ස්ථිරත්වයෙන් කාරක සභාව ගරු සභාව බවට පත් කරන ලදී.

- 2022-05-05 දින සිට බළන්ගොඩ නගර සභා මන්ත්‍රී මුල්ගම මුදලිහාමිගේ රවීන්ද්‍ර සමන් කවිරත්න මහතාගේ එක්සත් ජාතික පක්ෂ සාමාජිකත්වය අහෝසි කර ඇති බවත්, එදින සිට බළන්ගොඩ නගර සභාවේ ඔහු දරණ මන්ත්‍රී ධූරය අහෝසි වී පුරප්පාඩු වන බවත්, පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් පනත ප්‍රකාරව අවශ්‍ය කටයුතු සලසන ලෙසත් රත්නපුර, සහකාර මැතිවරණ කොමසාරිස් කාර්යාලයේ තේරීම් භාර නිලධාරී වෙත එක්සත් ජාතික පක්ෂ මහලේකම් විසින් යොමු කරන ලද ලිපියේ නගර සභාව වෙත එවා ඇති ලිපි පිටපත ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදී.

  මේ සම්බන්ධව ගරු සභාපතිතුමා අදහස් දක්වමින් නගර සභාවේ ලේකම්තුමා පැවසූ පරිදි මැතිවරණ කොමසාරිස් විසින් රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමාගේ නගර සභා මන්ත්‍රී ධූරය අහෝසි කර ඇති බවට ගැසට් නිවේදනයක් නිකුත් කර නොමැති බැවින් අද දින සභාවට එතුමා පැමිණියහොත් පිළිගැනීමට හැකි බව පැවසීය.

- විදේශ නිවාඩු ඉල්ලුම් පත් ඉදිරිපත් කිරීමේ දී ආයතන සංග්‍රහයේ XII පරිච්ඡේදයේ 1:4 වගන්තිය කෙරෙහි අවධානය යොමු කර කටයුතු කරන ලෙසත්, විදේශ නිවාඩු ඉල්ලුම්පත් අනුමැතියට ඉදිරිපත් කිරීමේ දී කාර්යාලවල සිදුවන ප්‍රමාදයන් වළක්වා ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා ලෙසත්, සබරගමු පළාත් ප්‍රධාන ලේකම් විසින් දන්වා ඇති අතර, ඒ අනුව මේ සම්බන්ධව සියලුම මහජන නියෝජිතයින් හා නිලධාරීන් දැනුවත් කරන ලෙස රත්නපුර සහකාර පළාත් පාලන කොමසාරිස්තුමා විසින් ACLG 01/10 හා 2022-05-25 දිනැතිව එවා ඇති ලිපිය ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදී.

- බළන්ගොඩ නගර සභා මහජන පොළ බුදු පිළිමය ඉදිරිපිට තමන් හට අයත් කඩ කාමරය වසා අසාධාරණයක් කළ බවත්, වසර 12 ක කාලයක සිට නියමිත පරිදි කඩ කුලී ගෙවමින් කුකුල් මස් කඩය පවත්වා ගෙන ගිය අතර, 2020.09.08 වන දින බළන්ගොඩ නගර සභාව විසින් කරන ලද දැනුම් දීම අනුව එම වෙළඳ ස්ථානය ඉවත් කර ගත් නමුත් මේ වන විට වෙනත් පුද්ගලයෙකු විසින් නැවත කුකුල් මස් කඩයක් එම ස්ථානයේම ආරම්භ කර ඇති බවත්, නව වෙළඳසැල් බුදු පිළිමය ඉදිරිපිට පවතින බැවින්

එම වෙළඳසැල් ඉවත් කිරීමට කටයුතු කරන ලෙසත් පවසමින් බළන්ගොඩ, නව මහජන පොළ පාර,161/1 ඩෙල්මෝ චිකන් ලිපිනයේ එස්.ඒ.එම්.ඉම්තියාස් යන අය එවා ඇති ලිපිය ගරු සභාපතිතුමා විසින් සභාගත කරන ලදී.

ගරු උප සභාපති එම්.ටී.එම්. රූමි මැතිතුමා අදහස් දක්වමින් මෙම ලිපිය සාධාරණ වන අතර, ඔහුට එම ස්ථානයේ කුකුල් මස් කඩය පවත්වාගෙන යාමට නොහැකි නම් තවත් පුද්ගලයෙකුට ඉඩ ලබා දීම නොකළ යුතු බව පැවසීය.

ගරු සභාපතිතුමා පැවසුවේ බුදු පිළිමය ඉදිරිපට කුකුල් මස් වෙළඳාම් කළ නොහැකි බවට නීතියක් නොමැති නමුත් එම වෙළඳාම සදාචාරාත්මක නොවිය හැකි අතර, ඒ සඳහා වෙළඳ බලපත්‍ර ලබා දී නොමැති බවයි.

ගරු නාගරික මන්ත්‍රී ඩබ්. එම්. එන්.පී. වීරසිංහ මැතිතුමා අදහස් දක්වමින් හිටපු ගරු ආණ්ඩුකාරතුමා වන ධම්ම දිසානායක මැතිතුමා විසින් සෞඛ්‍ය අතුරු ව්‍යවස්ථාවක් ඉදිරිපත් කර තිබූ අතර, එම අතුරු ව්‍යවස්ථාවට අනුව මස් ප්‍රදර්ශනය කර විකිණීම හා නගරයේ සෑම ස්ථානයකම විකිණීම තහනම් වන බව ද එම අතුරු ව්‍යවස්ථාවේ පිටපත් ගරු සභාවට බෙදා දෙන ලෙස ද පවසන ලදී.

- තමාගේ නිවස ඉදි කිරීමේ දී අසල ඇති වැසිකිළි වලෙන් අපද්‍රව්‍ය කාන්දු වූ අතර, වැසිකිළි වල සාදා ඇත්තේ ඉඩමේ මායිමේ බවත්, මේ සම්බන්ධව 2022-01-31 දින වැඩ අධිකාරීතුමාව ලිපියක් මඟින් දැනුවත් කළ අතර, එහි දී ඔහු හට එම වැසිකිළි වල ඉවත් කර ගන්නා බවට අදාල නිවැසියන් පවසා ඇති බවත්, ලිපිය භාර දී දින 36 කට පසු වැසිකිලි වල පැත්තේ තමාගේ නිවසේ බිත්තිය බැඳ අවසන් කර තිබූ අතර, වැසිකිළි වල ආරක්ෂා වී ඇත්තේ තමාගේ නිවසේ බිත්තියෙන් බවත්, එම ඉඩමේ එකතු වන වැසි ජලය එම වැසිකිළි වලට යාමට සලස්වා ඇති බවත් පවසමින් මේ සම්බන්ධ පියවරක් ගන්නා ලෙස බළන්ගොඩ, තුඹගොඩ, බුද්ධ ජයන්ති මාවත, අංක 34/5 ලිපිනයේ පදිංචි කේ.එල්. සංජීව ජයසිංහ යන අය විසින් එවා ඇති ලිපිය ගරු සභාපතිතුමා විසින් සභාගත කරන ලදී.

ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා අදහස් දක්වමින් මෙම කාරණය පිළිබඳව අවධානය යොමු කර අවශ්‍ය කටයුතු සිදු කර දෙන ලෙස ද වැසිකිළි වල නිසා දුගඳ හමන බව ද පවසන ලදී.

මේ සම්බන්ධව වැඩ අධිකාරීතුමාගෙන් කරුණු පැහැදිලි කර ගැනීම සඳහා ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් හා ගරු උප සභාපති එම්.ටී.එම්. රූමි මැතිතුමාගේ ස්ථිරත්වයෙන් ගරු සභාව කාරක සභාවක් බවට පත් කරන ලදී.

අදාල කරුණු පැහැදිලි කර ගැනීමෙන් අනතුරුව ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් හා ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමාගේ ස්ථිරත්වයෙන් කාරක සභාව ගරු සභාව බවට පත් කරන ලදී.

**04. ටෙන්ඩර්පත් හා මිළ ගණන් විවෘත කිරීම.**

**04:01 අඩු අදායම්ලාභීන් සඳහා සහන මලු බෙදා දීම (සහල්) සඳහා මිල ගණන් විවෘත කිරීම**

මිල ගණන් විවෘත කිරීම සඳහා ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් හා ගරු නාගරික මන්ත්‍රී කේ.ජී.පේමදාස මැතිතුමාගේ යෝජනා ස්ථිරත්වයෙන් මහ සභාව කාරක සභාව බවට පත් කරන ලදී.

අදාළ මිල ගණන් විවෘත කිරීමෙන් අනතුරුව ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් හා ගරු නාගරික මන්ත්‍රිනී ජී. චන්ද්‍රලතා මැතිතුමියගේ ස්ථිරත්වයෙන් කාරක සභාව මහ සභාව බවට පත් කරන ලදී.

ඒ අනුව,

| **ආයතනය** | **මිල (රතු කැකුළු සහල් රු.)** |
|---|---|
| සමනල ස්ටෝර්ස් | 284.00 |
| ජයන්ත ස්ටෝර්ස් | 245.00 |
| ධනසිරි ස්ටෝර්ස් | 240.00 |

යන ආයතනයන්ගෙන් මිල ගණන් ඉදිරිපත් වී තිබුණු අතර, අවම මිල ගණන් ඉදිරිපත් කර තිබූ ධනසිරි ස්ටෝර්ස් වෙතින් රු.240.00 බැගින් රතු කැකුළු සහල් කිලෝ ග්‍රෑම් 2500 ක් අඩු ආදායම්ලාභි පවුල් 125 ක් සඳහා මිල දී ගැනීම සුදුසු බවට ගරු සභාපතිතුමා කළ යෝජනාව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**05. කල් දී ඇති යෝජනා**

**05:01 ගරු සභාපති ඩබ්.ඒ.වසන්ත ගුණරත්න මැතිතුමා**

05:01:01 පොදු වෙළෙඳසැල අංක 17 දරණ කුකුළු මස් කඩ කාමර ගිවිසුම් කෙටුම්පත සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමා අදහස් දක්වමින් 2022-04-06 දිනැති මහ සභාවේ අංක 06:01:08 යටතේ බළන්ගොඩ නගර සභාව සතු පොදු වෙළඳසැල අංක 17 දරණ කුකුල් මස් කඩ කාමරය ටෙන්ඩර් කිරීමට සභා අනුමැතිය ලැබුණු අතර, එයට අදාල ගිවිසුම් කෙටුම්පත සඳහා සභා අනුමැතිය ලබා ගත යුතු බව පවසන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

05:01:02 බළන්ගොඩ නගර සභාවට අයත් නගර සභා උද්‍යානයේ පෝනියෙකු පැදවීම සඳහා වසරක කාලයක් වෙනුවෙන් අවසරය ලබා දීම වෙනුවෙන් වූ ගිවිසුම් කෙටුම්පත සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

05:01:03 බළන්ගොඩ නගර සභාවට අයත් බළන්ගොඩ තානායමේ ව්‍යාපාර කටයුතු ආර්ථික හා ඉන්ධන අර්බුදය හේතුවෙන් අඩාල වී ඇති නිසා 2022 මැයි,ජූනි හා ජූලි මාස සඳහා ගාස්තු අය කිරීමේ දී 50% ක සහනයක් ලබා දෙන ලෙසත්, මැයි මස දඩ මුදල වන රු.30,000.00 ක මුදල කපා හරින ලෙසත් තානායම් ටෙන්ඩර්කරු විසින් දන්වා ඇති අතර, මේ සම්බන්ධව තීරණයක් ගැනීම හා ඒ සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ. ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමා අදහස් දක්වමින් ඉන්ධන හා ගෑස් ඇතුළු භාණ්ඩ මිල ඉහළ යාම හේතුවෙන් තානායමේ ව්‍යාපාර කටයුතු අඩාල වී ඇති බව තානායම් ටෙන්ඩර්කරු විසින් දන්වා ඇති අතර අප්‍රේල් මාසය සඳහා වන ගාස්තුවලින් 50%ක් අඩු කිරීමට පසුගිය සභාවේ දී තීරණය කළ නමුත් මැයි මාසය සඳහා රු. 30,000.00 ක දඩ මුදලක් එකතු කර ඇති බව ද 2022 මැයි, ජූනි හා ජූලි මාස සඳහා වන ගාස්තුවලින් 50% බැගින් අඩු කර, රු. 30,000.00 ක දඩ මුදල කපා හරින ලෙස ඉල්ලා ඇති බව ද පවසන ලදී.

මෙහිදී අදහස් දැක් වූ ගරු නාගරික මන්ත්‍රිනී තරංගනී සමරසේකර මැතිතුමිය පැවසුවේ මෙම සහනය තානායම සඳහා පමණක් ලබා දීම අසාධාරණ බැවින් එසේ සහන ලබා දෙන්නේ නම් නගර සභාව විසින් ටෙන්ඩර් කරනු ලබන අනිකුත් කඩ සඳහා ද එම සහනය ලබා දෙන ලෙස තමන් ඉල්ලීමක් කරන බවයි.

ගරු උප සභාපති එම්.ටී.එම්. රූමි මැතිතුමා පිළිතුරු ලබා දෙමින් වෙළඳ ව්‍යාපාරිකයන්ගේ ඉල්ලීම අනුව සභාව විසින් සාකච්ඡා කර තීරණ ගන්නා අතර, ඔවුන්ගේ ඉල්ලීමක් නොමැතිව සහන ලබා දීම සිදු කළ නොහැකි බවත් මේ වන විට පවතින ආර්ථික අර්බුදය මත තානායම සඳහා සංචාරකයන් පැමිණීමේ අඩුවක් පවතින නිසා ටෙන්ඩර්කරු විසින් මැයි, ජූනි හා ජූලි මාස සඳහා සහන ඉල්ලා සිටින නමුත් ඉදිරි මාසයන් ගැන තීරණයක් ගත නොහැකි බැවින් මැයි මාසය සඳහා සහන ලබා දීම සුදුසු බවත් පවසන ලදි.

ගරු නාගරික මන්ත්‍රී චමික ජයමිණි විමලසේන මැතිතුමා අදහස් දක්වමින් තානායම සඳහා සහන ලබා දීම සම්බන්ධයෙන් විරුද්ධත්වයක් නොමැති නමුත් ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී. වීරසිංහ මැතිතුමාට ලබා දෙන සහයෝගයක් වශයෙන් මෙවැනි තීරණ ගන්නා බවට හා අනිකුත් අය පිළිබඳ නොසිතන බවට සමාජයෙන් පැවසිය හැකි බව ද ඒ ඒ මාසයන්හි

තානායමේ ආදායම් තත්ත්වය හඳුනා ගැනීමට යම්කිසි ක්‍රමවේදයක් පවතී නම් එවැනි ගැටලු ඇති නොවන බව ද පැවසීය.

මෙහි දී ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා පැවසුවේ ටෙන්ඩරයක් ලබා දුන් පසු එහි ආදායම් තත්ත්වය පරීක්ෂා කිරීමට නීත්‍යානුකූලව හැකිද යන්න ප්‍රශ්නයක් බවයි.

ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී. වීරසිංහ මැතිතුමා අදහස් දක්වමින් ආර්ථික අර්බුදය හේතුවෙන් තානායම හා එහි පවතින රට බීමහලට පැමිණෙන පාරිභෝගිකයන් සංඛ්‍යාව අඩු වී ඇති බව ද විවාහ උත්සවයන් සඳහා මාස කිහිපයකට පෙර තානායම වෙන් කිරීමේ දී යම් කිසි මිල ගණනකට එකඟ වන නමුත් උත්සවය පවතින අවස්ථාවේ භාණ්ඩ මිල ඉහළ යාම නොසලකා පෙර එකඟ වූ මිල ගණනට අවශ්‍ය පහසුකම් ලබා දීමට සිදු වන බව ද මේ පිළිබඳව සාධාරණව බලා මැයි,ජූනි හා ජූලි මාස සඳහා 50% ක සහනයක් හා මැයි මස දඩ මුදල කපා හැරීම සුදුසු බව ද පවසන ලදී.

මේ සම්බන්ධව පැවති සාකච්ඡාවෙන් අනතුරුව ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතියට යටත්ව බළන්ගොඩ තානායම සඳහා ගාස්තු අය කිරීමේ දී 2022 මැයි මාසය වෙනුවෙන් 50% ක් ගාස්තු අඩු කිරීම හා මැයි මාසයේ දඩ මුදල වන රු.30,000.00 ක මුදල කපා හැරීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමා ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**පෙ.ව. 11.21 ට පමණ ගරු නාගරික මන්ත්‍රී රවීන්ද්‍ර කවිරත්න මැතිතුමා ගරු සභාවට පැමිණෙන ලදී.**

05:01:04 ගිවිසුම්ගතව මාසික කුලී පදනම මත පොළ කඩ අංක 16 කඩ කාමරය එච්.එම්.බිසෝ මැණිකේ යන අය වෙත ලබා දී ඇති අතර, එම කඩ කාමරය බී.එම්.සුනේත්‍රා ජයවර්ධන යන අයට අතුරු බදු දීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රිනී ජී. චන්ද්‍රලතා මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

05:01:05 බළන්ගොඩ නගර සභා සීමාව තුළ මේ වන විට අනවසරයෙන් ඉදිකර ඇති හා දැනට භාවිතා වන අනවසර ගොඩනැඟිලි සම්බන්ධයෙන් දඩ මුදලක් අය කරගෙන කොන්දේසිවලට යටත්ව භාවිතයට ගැනීම සම්බන්ධව තීරණයක් ගැනීම වෙනුවෙන් සාකච්ඡා කිරීම හා ඒ සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ. ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමා අදහස් දක්වමින් මේ වන විට අනවසර ඉදිකිරීම් විශාල ප්‍රමාණයක් පවතින අතර, වර්ග අඩි 10,000 ක් වන විශාල ගොඩනැගිලි පවතින බව ද එම ගොඩනැගිලි ව්‍යාපාර සඳහා ලබා දී කඩ කුලී පවා අය කර ගන්නා බව ද ජල විදුලි පහසුකම් සලසා ගෙන ඇති නමුත් නීත්‍යානුකූල අවසරයකින් තොරව ඉදි කර ඇති බව ද මෙම විශාල ගොඩනැගිලි කඩා ඉවත් කිරීම කළ නොහැකි බැවින් දඩ මුදලක් අය කිරීම සුදුසු බව ද පවසන ලදී.

එමෙන්ම නගර සභාව විසින් ආදායම් උත්පාදන ව්‍යාපෘති ක්‍රියාත්මක කළ යුතු අතර, ඉදිකිරීම් සම්බන්ධව වගකීම නොගෙන ගොඩනැගිල්ල අනුමත කර දී දඩ මුදලක් අය කර ගැනීම මඟින් සභාවට අදායමක් ලබා ගත හැකි බැවින් මෙම යෝජනාව ඉදිරිපත් කළ බව ද වැඩිදුරටත් පැවසීය.

ගරු නාගරික මන්ත්‍රී චමික ජයමිණි විමලසේන මැතිතුමා අදහස් දක්වමින් අනවසර ඉදිකිරීම් සම්බන්ධ ලැයිස්තුවක් ලබා ගෙන සභාවට ඉදිරිපත් කරන ලෙස ද එහි දී වැඩ අධිකාරී හා කාර්මික නිළධාරී විසින් එම ඉදිකිරීම් සම්බන්ධ විස්තර සභාවට පැහැදිලි කර දිය යුතු බව ද මෙම අනවසර ඉදිකිරීම් සිදු කළ පුද්ගලයන්ට පවතින්නේ නීත්‍යානුකූලත්වයක් නොමැති ගැටලුව පමණක් බව ද එම නීත්‍යානුකූල තත්ත්වය ලබා දුනහොත් ඉදිකිරීම ආරම්භයේ සිට සියලුම වගකීම සභාවට ගැනීමට සිදුවන බව ද ඉදිරියේ දී නැවත ගැටලුවක් ඇති නොවන පරිදි මෙය ඉටු කිරීම සුදුසු බව ද පවසන ලදී.

මෙහි දී ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමා පැවසුවේ ඉදිකිරීමක් සිදු කිරීමේ දී පර්චස් 06 ක් අනිවාර්යෙන් තිබිය යුතු අතර, එසේ නොමැති ඉඩම්වල නීත්‍යානුකූලව අවසර ලබා ගැනීමට නොහැකි බැවින් අනවසර ඉදිකිරීම් 75%-90% සිදු කර ඇති බවයි. එමෙන්ම නාගරික සංවර්ධන අධිකාරිය හෝ මාර්ග සංවර්ධන අධිකාරිය අවසර ලබා නොදෙන නමුත් පරිසර ආරක්ෂාව හා සෞඛ්‍යයට හානියක් සිදු නොවීම සඳහා ගරු සභාපතිතුමාගේ බලය අනුව දඩ මුදලක් අය කර අවසර ලබා දිය හැකි බව ද පැවසීය.

ඒ අනුව සැලසුම් කමිටුව වෙත ඉදිරිපත් කරන ලදුව අදාල අත්‍යවශ්‍ය කරුණු තෘප්ත නොකිරීම මත ප්‍රතික්ෂේප කරන ලද නමුත් බළන්ගොඩ නගර සභා සීමාව තුළ මේ වන විට අනවසරයෙන් ඉදිකර ඇති හා දැනට භාවිතා කරන අනවසර ගොඩනැගිලි කොන්දේසිවලට යටත්ව හෝ දඩ මුදලක් අය කර හෝ අනුමත කිරීම සුදුසු බවටත්, මෙම යෝජනාව නාගරික සංවර්ධන අධිකාරිය වෙත යොමු කර ඔවුන්ගේ උපදෙස් හා නිර්දේශ මත ඉදිරි කටයුතු කිරීම සුදුසු බවටත් ගරු සභාපතිතුමන් විසින් කරන ලද සංශෝධිත යෝජනාව ගරු උප සභාපති එම්.ටී.එම්. රූමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

05:01:06 2022 ජාතික වෙසක් උත්සවය වෙනුවෙන් බළන්ගොඩ නගරයේ විදුලි ආලෝකකරණය සිදු කිරීම සඳහා පැමිණි වොල්ඩින් ඉලෙක්ට්‍රිකල්ස් ආයතනය වෙත ආහාර, නවාතැන් පහසුකම් හා ගමන් වියදම් වෙනුවෙන් රු.75,000.00 ක මුදලක් ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමා අදහස් දක්වමින් 2022 වර්ෂයේ අයවැය ප්‍රතිපාදන මගින් ජාතික වෙසක් උත්සවය වෙනුවෙන් බළන්ගොඩ විදුලි ආලෝකයෙන් ආලෝකමත් කිරීම සඳහා රුපියල් මිලියනයක මුදලක් වෙන් කර තිබූ අතර, එම මුදල වියදම් කිරීම සඳහා 2022-04-06 දිනැති මහ සභාවේ අංක 06:01:19 යටතේ අනුමත වූ බව ද ඒ අනුව මිල ගණන් කැඳවා වොල්ඩින් ඉලෙක්ට්‍රිකල්ස් ආයතනයෙන් අදාල සේවාව ලබා ගැනීමට තීරණය වූ බව ද පවසන ලදී.

එමෙන්ම ගරු ආණ්ඩුකාරතුමා විසින් Zoom තාක්ෂණය ඔස්සේ පවත්වන ලද සාකච්ඡාවේ දී වාචිකව ලබා දුන් උපදෙස් මත මැයි මස 09 වෙනිදා උදේ බළන්ගොඩට අදාල පිරිස පැමිණි අතර, 10 වෙනිදා සිට සියලු කටයුතු ආරම්භ කිරීමට සූදානම් කර තිබූ නමුත් 2022-05-09 දින දහවල් රට තුළ ඇති වූ කළහකාරී තත්ත්වය හේතුවෙන් එය ඉටු කිරීමට නොහැකි වූ බව පැවසීය.

කෙසේ නමුත් 2022-05-09 වන දින වොල්ඩින් ඉලෙක්ට්‍රිකල්ස් ආයතනය කොළඹ සිට අවශ්‍ය උපකරණ, සේවකයන් හා වාහන රැගෙන බළන්ගොඩ වෙත පැමිණීම නිසා ආහාර, නවාතැන් හා ප්‍රවාහන පහසුකම් සඳහා ඔවුනට වැය වූ වියදම වෙනුවෙන් රු.75,000.00 ක මුදලක් ලබා දෙන ලෙස ඉල්ලීමක් කර ඇති බව ද 2022 වර්ෂයේ අයවැය ප්‍රතිපාදන මගින් ජාතික වෙසක් උත්සවය සඳහා වෙන් කරන ලද රුපියල් මිලියනයක මුදලින් රු 75,000.00 ක මුදල ගෙවීම සුදුසු බව ද වැඩිදුරටත් ගරු සභාපතිතුමා පැවසීය.

මේ සම්බන්ධව ගරු නාගරික මන්ත්‍රී චමික ජයමිණි විමලසේන මැතිතුමා අදහස් දක්වමින් මෙවැනි අනවශ්‍ය කටයුතු සිදු කිරීම අද රට පත්ව ඇති තත්ත්වයට හේතු වී ඇති බව ද මිනිසුන්ට යථාර්ථය නොපෙන්වා ආර්ථිකය හැසිරවීම සිදු කර ඇති බව ද බළන්ගොඩ ජාතික වෙසක් උත්සවය පවත්වන්නේ නම් බෞද්ධ කටයුතු අමාත්‍යාංශය හා සබරගමුව පළාත් සභාව විසින් ඒ සඳහා අවශ්‍ය කටයුතු සිදු කළ යුතු බව ද ආලෝකකරණයක් සඳහා පමණක් ලක්ෂ 10 ක් වැය කිරීමෙන් එහි පැවැත්මක් නොමැති බව ද පවසන ලදී.

එමෙන්ම තමන් නගර සභාවේ සභාපති වශයෙන් සිටි අවුරුදු 04 ක කාලය තුල රට පුරා පැවති මුද්දර ගාස්තු එකතු කර ගනු ලැබුවේ ජනතාව වෙනුවෙන් සේවය සැලසීමට හා නගර සභාවට ආදායමක් ලැබී වටිනාකමක් ලබා දෙන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට බව ද එම මුදල් මෙවැනි නිෂ්ඵල වියදම් සඳහා යෙදවීම නොකළ යුතු අතර, ඉදිරියට ප්‍රයෝජනවත් වන වැඩ කටයුතු සඳහා මුදල් වියදම් කිරීම සඳහා සභාවේ ගරු මන්ත්‍රීවරුන්ගේ අවධානය යොමු වේවා යි ප්‍රාර්ථනා කරන බව ද මෙම රු.75,000.00 ක මුදල ගෙවීමට විරුද්ධත්වයක් නොමැති බව ද වැඩිදුරටත් පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී. වීරසිංහ මැතිතුමා අදහස් දක්වමින් කුරගල පිබිදීමත් සමඟ බළන්ගොඩ ඇතුළු ප්‍රදේශය තුල අති දියුණු බෞද්ධ ප්‍රබෝධයක් ඇති වූ බව ද වෙසක් පොසොන් පෝය දෙකටම සෑම නගරයකම සැරසිලි සිදු කරන බව ද මෙම ලක්ෂ 10 ක මුදල 2022 අයවැය මගින් වෙන් කරන ලද අතර, එම අයවැය අනුමත කරන ලද්දේද ගරු නාගරික

මන්ත්‍රී චමික විමලසේන මැතිතුමා බව ද එතුමා සභාපති වශයෙන් සිටින කාලයේ දී ගරු ආණ්ඩුකාරතුමා මේ සම්බන්ධව අවශ්‍ය කටයුතු කරන ලෙස පැවසුවේ නම් එය ඉටු කරන බව ද එබැවින් හැමදේටම විරුද්ධ නොවන ලෙස ද බළන්ගොඩ මිහිඳු පෙරහැර සඳහා ලක්ෂ 15 හෝ 16 වියදම් කිරීම වැරදි බව පැවසුව ද එවැනි දේ නගරයක තිබිය යුතු බව ද පැවසීය.

ගරු සභාපතිතුමා නැවත වරක් අදහස් දක්වමින් ජාතික වෙසක් උත්සවය කොළඹින් පිටත ප්‍රදේශයකට ලැබුණු පළමු අවස්ථාව මෙය වන අතර, කුරගල හේතුවෙන් එම ප්‍රදේශයේ ජනතාවගේ ආදායම් තත්ත්වය ඉහළ ගොස් දියුණු වීමක් සිදු වූ බවත්, විදුලි ආලෝකකරණය සඳහා ලක්ෂ 10 ක මුදලක් වියදම් කිරීම තමන්ගේ තනි මතයකට සිදු වූ දෙයක් නොව සභාවේ අනුමැතිය සමඟ සිදු වූ දෙයක් බව ද අවුරුදු දෙකකට පෙර හිටපු සභාපතිතුමා විසින් බළන්ගොඩ නගරයම සැරසූ අතර, ඒ සඳහා විරුද්ධ නොවූ බව ද පවසන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

05:01:07 ඩෙංගු රෝග ව්‍යාප්තිය වැළැක්වීම වෙනුවෙන් කාණු පද්ධතිය පිරිසිදු කිරීම සඳහා රු.97,200.00 ක මුදලක් වැය වෙන බැවින් ඒ සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මේ සම්බන්ධව ගරු සභාපතිතුමා අදහස් දක්වමින් බළන්ගොඩ නාගරික බල ප්‍රදේශය තුල මේ වන විට ඉතා සීඝ්‍රයෙන් ඩෙංගු රෝගය ව්‍යාප්ත වීමේ අවදානමක් ඇති අතර, නගරයේ කාණු පද්ධතිය අපිරිසිදු වී ඇති බව දක්නට ලැබෙන බව ද එම කාණු පද්ධති දෛනික වැටුප් ගෙවා පිරිසිදු කළ යුතුව ඇති බැවින් ඒ සඳහා රු.97,200.00 ක මුදලක් වැය වෙන බව ද පවසන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

05:01:08 කඩදාසි මිල ගණන් ඉහළ යාම හේතුවෙන් 2022-06-01 දින සිට ක්‍රියාත්මක වන පරිදි වරිපනම් ඔප්පු ලුහුඬු පිටපත් සඳහා නව සංශෝධන ගාස්තු වශයෙන් රු.1,500.00 ක මුදලක් අය කිරීම හා සභාවේ ආදායම් තත්ත්වය සලකා බලා හිස් ඉඩම් සඳහා තක්සේරු වටිනාකම රු. 2,000.00 ක් ලෙස තාවකාලිකව තක්සේරු කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රීනී ජී. චන්ද්‍රලතා මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමා අදහස් දක්වමින් 2022-06-01 දිනට පෙර වරිපනම් ඔප්පු ලුහුඬු පිටපත් ගාස්තු ලෙස රු.700.00 ක් අය කළ අතර, හිස් ඉඩම් සඳහා තක්සේරු වටිනාකම රු.1,000.00 ක්ව පැවති නමුත් කඩදාසි මිල ගණන් ඉහළ යාම හේතුවෙන් 2022-06-01 දින සිට ක්‍රියාත්මක වන පරිදි වරිපනම් ඔප්පු ලුහුඬු පිටපත් සඳහා නව සංශෝධන ගාස්තු වශයෙන් රු.1,500.00 ක මුදලක් අය කිරීම හා සභාවේ ආදායම් තත්ත්වය සලකා බලා හිස් ඉඩම් සඳහා තක්සේරු වටිනාකම රු. 2,000.00 ක් ලෙස තාවකාලිකව තක්සේරු කිරීම සුදුසු බව පවසන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

05:01:09 2022 ජනවාරි, පෙබරවාරි හා මාර්තු මාසවලට අදාලව රු. 36,530.91 ක මුදලක් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ. ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

05:01:10 බස් නැවතුම්පොළෙහි සවි කර තිබූ විද්‍යුත් දැන්වීම් පුවරුව පසුගිය දිනක යම් පුද්ගලයෙක් විසින් කපා ගෙන ගොස් ඇති බැවින් නැවත ස්ථානගත කරන තුරු ගිවිසුම් මත ලබා ගෙන සිටින ඩී.එස්.බී. පී.අබේගුණවර්ධන යන අයගේ ගිවිසුම අවලංගු කර,ගිවිසුම් ඇප නිදහස් කර දීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මේ සම්බන්ධව පොලිස් වාර්තාවක් හෝ ඉදිරිපත් කර නොමැති බැවින් මෙම යෝජනාව සභාවේ ප්‍රතික්ෂේප විය.

05:01:11 බළන්ගොඩ නගර සභා ක්‍රීඩා පිටියේ සංගීත ප්‍රසංගයක් පැවැත්වීම සඳහා 2022-03-28 දින එස්.එමිල් ප්‍රියශාන්ත යන අය විසින් රු.50,000.00 ක මුදලක් තැන්පත් කළ අතර ප්‍රසංගය නොපැවැත්වුණු බැවින් එම මුදල ආපසු ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රිනී ජී. චන්ද්‍රලතා මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

05:01:12 ඉන්ධන අර්බුදය හේතුවෙන් 2022 මැයි මාසයේ රථවාහන නැවතුම් ගාස්තු සඳහා සහනයක් ලබා දෙන ලෙස රථවාහන ටෙන්ඩර්කරු විසින් ඉල්ලා ඇති අතර, ඒ සම්බන්ධව තීරණයක් ගැනීම හා ඒ සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු උප සභාපති එම්.ටී.එම්. රුමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමා අදහස් දක්වමින් ඉන්ධන අර්බුදය නිසා දිගු පෝලිම් නිර්මාණය වී ඇති බැවින් වාහන සඳහා ටිකට්පත් නිකුත් කිරීම සිදු කළ නොහැකි වූ නිසා මැයි මාසයේ පහත සඳහන් දිනයන් සඳහා රථවාහන නැවතුම් ගාස්තු ගෙවීමේ දී සහනයක් ලබා දෙන ලෙස ටෙන්ඩර්කරු විසින් ඉල්ලා ඇති බව පවසන ලදී.

- 2022 මැයි 01 - මැයි දිනය
- 2022 මැයි 02 - රජයේ නිවාඩු දින
- 2022 මැයි 03 - රාමසාන් දිනය
- 2022 මැයි 06,07 හා 08 - උද්ඝෝෂණ පැවති දින 03
- 2022 මැයි 10,11,12 හා 13 - ඇඳිරිනීතිය පැවති දින 04
- 2022 මැයි 15 සහ 16 - වෙසක් පෝය නිවාඩු 02

ඒ අනුව ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතියට යටත්ව රථ වාහන නැවතුම් ගාස්තු අය කිරීමේ දී 2022 මැයි මාසය සඳහා වන ගාස්තුවලින් 50%ක් අඩු කිරීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

05:01:13 ඉන්ධන අර්බුදය හේතුවෙන් 2022 මැයි මාසයේ බස්රථ ධාවනය අඩු වූ බැවින් පෞද්ගලික බස් ගාල් ගාස්තු අය කිරීමේ දී මැයි මාසය සඳහා සහනයක් ලබා දෙන ලෙස අදාල ටෙන්ඩර්කරු විසින් ඉල්ලා ඇති අතර, ඒ සම්බන්ධව තීරණයක් ගැනීම හා ඒ සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රිනී ජී. චන්ද්‍රලතා මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

මෙහි දී ගරු සභාපතිතුමා පැවසුවේ බළන්ගොඩ මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය විසින් 2022 මැයි මාසයේ බස් රථ 32% ක් ධාවනය වූ බවට දන්වා ඇති බවයි.

ඒ අනුව ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතියට යටත්ව පෞද්ගලික බස් ගාල් ගාස්තු අය කිරීමේ දී 2022 මැයි මාසය සඳහා වන ගාස්තුවලින් 60%ක් අඩු කිරීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

05:01:14 ආහාර අර්බුදය හමුවේ දෛනික එළවළු අවශ්‍යතාවය ඉටු කර ගැනීම අරමුණු කරගනිමින් බළන්ගොඩ නගර සීමාවේ පවුල් ඒකක 100 ක් සඳහා ශක්ති ගෙවතු වගා ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මේ සම්බන්ධව ගරු සභාපතිතුමා අදහස් දක්වමින් බළන්ගොඩ නගර සභා බල ප්‍රදේශය තුල ජීවත් වන ජනතාවගේ ආහාර අර්බුදයට කිසියම් හෝ ශක්තියක් වීම සඳහා ගෙවතු වගා 100 ක් ඇති කිරීම හා සාර්ථක ගෙවතු වගා 10 ක් සඳහා ත්‍යාග හා සහතිකපත් මෙන්ම සහභාගිත්ව ඇගයීම් සහතික පත් පිරිනැමීමට බලාපොරොත්තු වන බව ද ගෙවතු වගා ව්‍යාපෘතිය සඳහා පිරිවැය ඇස්තමේන්තුව රු. 65,000.00 ක් වන බව ද පැවසීය.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

05:01:15 2022 වර්ෂය තුළ තෝරාගත් අඩු ආදායම්ලාභීන් සඳහා වැසිකිළි ආධාර ලබා දීමේ නාම ලේඛනයට ඇතුලත් කර තිබූ රුවන් කුට්ටියලාගේ ගුණපාල යන අයගේ නම ඉවත් කර, ලියන ආරච්චිගේ සුරේඛා යන අයගේ නම ඇතුලත් කර වැසිකිළි ආධාර ලබා දීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු උප සභාපති එම්.ටී.එම්.රුමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මේ සම්බන්ධව ගරු සභාපතිතුමා අදහස් දක්වමින් 2022 වර්ෂයේ අඩු ආදායම්ලාභීන් සඳහා වැසිකිළි ආධාර ලබා දීම යටතේ ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතියට ඉදිරිපත් කළ නාම ලේඛනයේ ඇතුලත් කර තිබූ නො.63/11, රාස්සගල පාර, බළන්ගොඩ යන ලිපිනයෙහි පදිංචි රුවන් කුට්ටියලාගේ ගුණපාල යන අය මේ වන විට වැසිකිළියක් තනා ඇති බව ක්ෂේත්‍ර පරීක්ෂණයේ දී අනාවරණය වී ඇති බැවින් රුවන් කුට්ටියලාගේ ගුණපාල යන අයගේ නම ලේඛනයෙන් ඉවත් කර, නො. එල්/7 1/1, බැංකියවත්ත, වෙට්නෝල් පාර, බළන්ගොඩ ලිපිනයේ පදිංචි ලියනආරච්චිගේ සුරේඛා යන අයගේ නම ඇතුලත් කර ඇය වෙත වැසිකිළි ආධාරය ලබා දීම සුදුසු බව පවසන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

05:01:16 ඉදිරියේ දී ඇති විය හැකි ආහාර හිඟයට පෙර සූදානමක් වශයෙන් වැවවත්ත ප්‍රජාශාලාව පිහිටි නගර සභාවට අයත් ඉඩමේ හිස්ව ඇති පර්චස් 40 ක පමණ ප්‍රමාණය ප්‍රදේශවාසී ජනතාව සහය කරගෙන වගා කිරීම සඳහා ලබා දෙන ලෙස 256 සී, තුඹගොඩ ග්‍රාම නිළධාරී විසින් ඉල්ලා ඇති අතර, ඒ සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමා අදහස් දක්වමින් වැවවත්ත ප්‍රජා ශාලාව පිහිටි නගර සභාවට අයත් ඉඩමේ පර්චස් 40 ක පමණ කොටස කිසිඳු වගාවක් නොමැතිව ඇති බැවින් ප්‍රදේශවාසී ජනතාව සහය කරගෙන බතල, කිරි අල හා මඤ්ඤොක්කා වැනි තාවකාලික වගාවන් කිරීමට අපේක්ෂා කරන බැවින් ඒ සඳහා අවශ්‍ය අනුමැතිය ලබා දෙන ලෙස 256 සී, තුඹගොඩ ග්‍රාම නිළධාරී විසින් ඉල්ලීමක් කර ඇති බව ද වර්තමාන අර්බුදකාරී තත්ත්වය හේතුවෙන් ඉදිරියේ දී ආහාර හිඟයක් ඇති විය හැකි බැවින් මෙම ඉඩම ඵලදායී හා ආදර්ශයක් වන පරිදි භාවිතයට ගැනීම සුදුසු බව ද පවසන ලදී.

මේ පිළිබඳව ඇති වූ සාකච්ඡාවෙන් අනතුරුව නගර සභාවට ඇති අයිතියට හානියක් නොවන පරිදි ප්‍රදේශයේ ජනතාව සමඟ හිස් භූමියේ වගා කිරීම සඳහා මූලිකත්වය ගනු ලබන ග්‍රාම නිළධාරී සමඟ ගිවිසුම්ගතව වසරක කාලයක් සඳහා තාවකාලික වගාවන් සිදු කිරීමට පමණක් වැවවත්ත ප්‍රජාශාලාව පිහිටි නගර සභාවට අයත් ඉඩමේ පර්චස් 40 ක පමණ ප්‍රමාණය ලබා දීම

සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමා ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

05:01:17 සභාපති අරමුදල ගිණුමේ චෙක්පත් අත්සන් කිරීම සඳහා දෙවන අත්සන වශයෙන් ගරු නාගරික මන්ත්‍රී/මන්ත්‍රීවරියන් දෙදෙනෙකු නම් කිරීම හා ඒ සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මේ සඳහා ගරු උප සභාපති එම්.ටී.එම්. රූමි මැතිතුමා හා ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා සුදුසු බවට සභාවේ දී අදහස් ඉදිරිපත් විය.

ඒ අනුව සභාපති අරමුදල ගිණුමේ චෙක්පත් අත්සන් කිරීම සඳහා දෙවන අත්සන වශයෙන් ගරු උප සභාපති එම්.ටී.එම්. රූමි මැතිතුමා සහ ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව එය ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ. ප්‍රේමකුමාර මැතිතුමා ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**06. මන්ත්‍රී යෝජනා**

06:01 **ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය**

06:01:01 නගර සභාව සඳහා පුටු 100, හට් එකක්, කොඩි කණු 25, බෞද්ධ කොඩි 25 ක් ලබා ගැනීමට කටයුතු කිරීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රිනී මංගලිකා ඉලංකෝන් මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

මේ සම්බන්ධව අදහස් දක් වූ ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය, රටේ පවතින ආර්ථික අපහසුතාවය හේතුවෙන් ජනතාව විශාල පීඩාවකට ලක් වී ඇති බව ද අවමංගල හෝ වෙනත් සාමාන්‍ය උත්සවයක් සඳහා පුටු, හට් ඇතුළු භාණ්ඩ කුලියට ගැනීමේ දී විශාල මුදලක් වියදම් කිරීමට සිදු වන බැවින් යම් සහනදායී මුදලකට මෙම භාණ්ඩ ලබා දීම වෙනුවෙන් තමන් ඉහත යෝජනාව කරන බව ද පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රී එම්.ජුනයිදීන් මලික්ෂා මැතිතුමා අදහස් දක්වමින් කොඩි සහ කණු ලබා ගැනීම සඳහා තමන් එකඟ නමුත් පුටු ලබා ගැනීමට එකඟ නොවන බව ද හිටපු ගරු සභාපති ඩබ්.එම්.එන්.ජී. වීරසිංහ මැතිතුමාගේ කාලය තුළ පුටු 400 ක් පමණ තිබුණු නමුත් අද වන විට එක පුටුවක් හෝ නොමැති බව ද සෑම සමිතියකම පුටු තිබෙන බව ද පැවසීය.

ගරු නාගරික මන්ත්‍රිනී ජී. චන්ද්‍රලතා මැතිතුමිය පැවසුවේ මෙම යෝජනාවට තමන් එකඟ වන අතර අධීක්ෂණයක් හා ව්‍යවස්ථාවක් අනුව පුටු ලබා දෙන්නේ නම් පුටු අඩු වීමේ ගැටලුවක් මතු නොවන බවයි.

මේ සම්බන්ධව අදහස් දක් වූ එම්.ඩබ්. විමලසිරි මැතිතුමා, කොට්ඨාස භාර මන්ත්‍රීවරයාගෙන් ලිපියක් ලබා ගෙන එහි වගකීම එම මන්ත්‍රීවරයාට ලැබෙන පරිදි මෙය ක්‍රියාත්මක කරන ලෙසට තමන් යෝජනා කරන බව පැවසීය.

ගරු නාගරික මන්ත්‍රී චමික ජයමිණි විමලසේන මැතිතුමා අදහස් දක්වමින් හිටපු ගරු සභාපතිතුමාගේ පාලන කාලයේ දී කොඩි කණු, හට්, පුටු සඳහා වූ දේ දුටු බව ද මෙම භාණ්ඩ ඉල්ලනු ලබන්නේ හිතවතුන් වන නිසා මුදල් ගැනීමේ අපහසුතාවයක් පවතින අතර, අවමංගල අවස්ථා වෙනුවෙන් කරනු ලබන ඉල්ලීම් සඳහා මුදල් ලබා ගැනීමට නොහැකි බව ද බොහෝ විට මෙම භාණ්ඩ යලි ගෙන ඒමට සභාවේ වාහන යොදා ගත් බව ද අධීක්ෂණය සඳහා නිලධාරියෙකු යොදවන ලෙස පැවසුව ද බොහෝ අවස්ථාවල දී රාත්‍රී කාලයේ පුටු හට් ඉල්ලගෙන එන බව ද මෙම යෝජනාවට තමන් විරුද්ධ නොවන අතර, යථාර්තය පැහැදිලි කළ බව ද පවසන ලදී.

ගරු සභාපතිතුමා පැවසුවේ ගරු නාගරික මන්ත්‍රී චමික ජයමිණි විමලසේන මැතිතුමා පැවසූ කාරණය සත්‍ය වන අතර, ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීමේ දී ගැටලු මතු වන බව ද සමස්ථයක් වශයෙන් 90% ක් පමණ සමිතිවලින් ආවරණය වන අතර, ඡන්ද අපේක්ෂකයන් විසින් පුටු, හට් සමිති සඳහා බෙදා දෙන බව ද මෙම යෝජනාවට විරුද්ධ නොමැති බව ද පැවසීය.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**06:02 ගරු නාගරික මන්ත්‍රිනී අයි.ඒ.එම්.ඉලංගකෝන් මැතිතුමිය**

06:02:01 ඇල්ලෙපොල සරස්වතී මාර්ගයේ කාණු පද්ධතිය සංවර්ධනය කිරීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රිනී එම්.ශාන්තිලේඛා මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07. කාරක සභා වාර්තා, කමිටු වාර්තා සළකා බැලීම.**

**07:01 2022-06-02 දිනැති කර්මාන්ත කමිටු වාර්තාව**

i. සංවර්ධන කටයුතු සඳහා ලබා දෙන මන්ත්‍රී යෝජනා වෙනුවෙන් නිර්දේශ ලබා දීම

මෙදින සභාවට ඉදිරිපත් කරන ලද කාරක සභා වාර්තාවල සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කිරීම ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

**08. ආදායම් වියදම් වාර්තා සළකා බැලීම.**

**2022-05-01 සිට 2022-05-31 දක්වා ආදායම් හා වියදම්**

| | |
|---|---|
| පුනරාවර්තන ලැබීම් | 9,103,873.98 |
| වෙනත් ලැබීම් | 858,745.33 |
| මුලු ලැබීම් | 9,962,619.31 |
| පුනරාවර්තන වියදම් | 8,135,251.19 |
| වෙනත් වියදම් | 4,703,038.70 |
| මුලු වියදම් | 12,838,289.89 |

**2022-05-01 සිට 2022-05-31 දක්වා ඉන්ධන වාර්තාව**

| වාහන අංකය | මුළු එකතුව |
|---|---|
| 56-1906 | 16,000.00 |
| 227-5020 | 96,000.00 |
| RD - 8240 | 54,000.00 |
| 226-7521 | 48,000.00 |
| BC-0005 | 90,020.00 |
| GC 0001 | 12,600.00 |
| LL - 7688 | 16,000.00 |
| DPP 0006 | 24,200.00 |
| JD-4684 | 10,080.00 |
| ND-5124 | 48,000.00 |
| PF-4006 | 96,320.00 |
| QL-2901 | 6,804.00 |
| RC-1107 | 85,932.00 |
| RC 1118 | 48,000.00 |
| GK 1483 | 115,200.00 |
| RD 8000 | 27,200.00 |
| LL 2110 | 26,400.00 |
| VI 1833 | 10,870.00 |
| Re 2600 | 96,400.00 |
| UQ1933 | 8,400.00 |
| HF 7899 | 44,000.00 |
| HF 7899 | 800.00 |
| HF 7899 | 32,000.00 |
| HF 7899 | 6,105.00 |
| එකතුව | 1,019,331.00 |

මෙදින සභාවට ඉදිරිපත් කරන ලද ආදායම් වියදම් වාර්තා හා ඉන්ධන වාර්තා සඳහා විරෝධතා ඉදිරිපත් නොවූ හෙයින් ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

**09. ඇස්තමේන්තු අනුමත කිරීම**

**09.01 ගරු සභාපති ඩබ්.ඒ.වසන්ත ගුණරත්න මැතිතුමා**

09:01:01 සේනක පෙදෙස නිවාස කිහිපයක් (ටයිටස් මයාගේ නිවස) හරහා වැසි ජලය හා අපද්‍රව්‍ය ගලා යාම වැළැක්වීම සඳහා පැති බැම්ම සැකසීම සඳහා වන ඇස්තමේන්තුව අනුමත කිරීම (ඇස්තමේන්තුගත මුදල 730,000.00)

09:01:02 සේනක පෙදෙසේ නිවෙස්වලට පස් කඩා වැටෙන ස්ථානයේ පැති බැම්ම සැකසීම සඳහා වන ඇස්තමේන්තුව අනුමත කිරීම (ඇස්තමේන්තුගත මුදල 2,500,000.00)

09:01:03 වතුකාරගොඩ කරච්කැටිය ගල්වල පාරේ පැති බැම්ම සකස් කිරීම සඳහා වන ඇස්තමේන්තුව අනුමත කිරීම (ඇස්තමේන්තුගත මුදල 990,000.00)

ඉහත සඳහන් ඇස්තමේන්තු යෝජනා ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා ස්ථිර කරන ලදී.

ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය අදහස් දක්වමින් උඩකන්ද මාර්ගය සංවර්ධනය කිරීමේ දී කාණු පද්ධතිය සකස් කරන ලෙස පැවසූ නමුත් එය ඉටු නොකළ නිසා අද වන විට තාර කොටස් ගැලවී යන බව ද උඩකන්ද සිට එන ජලය කාණුවට හැරවීමට නොහැකි වන ලෙස ගලක් පවතින අතර, එම ගල ඉවත් කර එය සකස් කරන ලෙස ද ලක්ෂ 05 ක් පමණ වැයවෙන නමුත් තවදුරටත් ප්‍රමාද වුවහොත් ලක්ෂ ගණන් වියදම් කළ සකස් කළ මාර්ගයෙන් ප්‍රයෝජනයක් නැති විය හැකි බව ද පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා වතුකාරගොඩ පැති බැම්ම කඩා වැටීම සම්බන්ධව අදහස් දැක් වූ අතර, ඒ සඳහා ඇස්තමේන්තු සකස් කර තමන්ට අයවැයෙන් වෙන් කරන ලද ලක්ෂ 10 ක මුදලින් සිදු කිරීමට සැලසුම් කළ ද එය ඉටු කර ගැනීමට නොහැකි වූ නමුත් අත්‍යවශ්‍යව ඉටු කළ යුතු සේවාවක් වශයෙන් ඉටු කර දෙන මෙන් ඉල්ලා සිටින බව පැවසිය.

**විරෝධතා නොවූ හෙයින් ඉහත ඇස්තමේන්තු යෝජනා ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**10. පෞද්ගලික මන්ත්‍රි පැහැදිලි කිරීම්**

**ගරු නාගරික මන්ත්‍රිනී මංගලිකා ඉලංකෝන් මැතිතුමිය**

ගරු නාගරික මන්ත්‍රිනී මංගලිකා ඉලංකෝන් මැතිතුමිය අදහස් දක්වමින් ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී අකිල සාලිය එල්ලාවල මැතිතුමා, බළන්ගොඩ ප්‍රාදේශීය සභාවේ ගරු සභාපතිතුමා හා නගර සභාවේ ගරු සභාපතිතුමාගේ නිවාසවලට හා දේපලවලට සිදු වූ හානිය සම්බන්ධව කණගාටුව පළ කරන බව ද දේශපාලනය සඳහා අවතීර්ණ වී සතුටින් සේවය කරන අතරතුර සිදු වූ මේ සිද්ධිය නිසා දේශපාලනය සම්බන්ධව කළකිරීමට පත් වූ බව ද මෙය හෙළා දකින බව ද පවසන ලදී.

**ගරු නාගරික මන්ත්‍රිනී එම්. ශාන්තිලේඛා මැතිතුමිය**

ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී අකිල සාලිය එල්ලාවල මැතිතුමා, බළන්ගොඩ ප්‍රාදේශීය සභාවේ ගරු සභාපතිතුමා හා නගර සභාවේ ගරු සභාපතිතුමාගේ නිවාසවලට හා දේපලවලට සිදු වූ හානිය සම්බන්ධව කණගාටුව පළ කරන බව ද පසුගිය දිනක තමන්ගේ ඥාතිවරයෙකු මිය ගිය අතර, එම අවස්ථාවට සහභාගී වූ සියලුම දෙනාට ස්තුතිවන්ත වන බව ද පවසමින් තම අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**ගරු නාගරික මන්ත්‍රී චමික ජයමිණි විමලසේන මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී චමික ජයමිණි විමලසේන මැතිතුමා අදහස් දක්වමින් තමන් ප්‍රකාශ කරන සෑම වචනයක්ම වගකීමෙන් යුතුව ප්‍රකාශ කරන බව ද කිසිදු පුද්ගලයෙක් සමඟ වෛරයක් ක්‍රෝධයක් නොමැති

අතර, එක් එක් අය විසින් ඇති කරගත් මානසිකත්වය අනුව තමාව මැනීම නොකරන ලෙසද තමන් කිසිදු දේශපාලන පක්ෂයකට, ආගමකට, ජාතියකට හෝ කණ්ඩායමක් කෙරෙහි වැඩි පක්ෂපාතිත්වයක් දක්වමින් වැඩ කරන අයකු නොවන අතර සහෝදරත්වයෙන් සිටින බව ද පවසන ලදී.

එමෙන්ම පසුගිය මැයි මස 09 වනදා හිටපු ගරු අගමැතිතුමා හා මැති ඇමතිවරු කණ්ඩායමක් විසින් ඔවුන් කෙරෙහි ප්‍රාණ සමානව ආදරය කරන පිරිසක් අරලිය ගහ මන්දිරයට කැඳවා ප්‍රකෝපකාරී ලෙස හැසිරවීමට අවශ්‍ය සියල්ල සිදු කර ඇති කළ පහරදීම්වල ප්‍රතිඵලයක් ලෙස විවිධ වූ කණ්ඩායම් රට තුල ප්‍රචණ්ඩකාරී ලෙස හැසිරුණු අතර, ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී අකිල සාලිය එල්ලාවල මැතිතුමා, බළන්ගොඩ ප්‍රාදේශීය සභාවේ ගරු සභාපතිතුමා හා නගර සභාවේ ගරු සභාපතිතුමා ඇතුලු බොහෝ පිරිසකට එම ප්‍රතිඵලයන් අත්විඳීමට සිදු වූ බව ද ඒ සම්බන්ධව කණගාටුව ප්‍රකාශ කරන අතර, ගාලු මුවදොර පිටියේ පහර කෑමට ලක් වූ අය වෙනුවෙන් තම කණගාටු ප්‍රකාශ කරන බව ද පැවසීය.

ගරු නාගරික මන්ත්‍රී චමික ජයමිණි විමලසේන මැතිතුමා තවදුරටත් අදහස් දක්වමින් ගරු සභාපතිතුමා සභාපතිත්වයට පත් වූයේ ද එවැනිම අරගලයක් සිදු කරමින් බව ද අද වන විට බළන්ගොඩ නගරයේ පිරිසිදුතාවය නැති වී ගොස් ඇති අතර, පොස්ටර් බැනර් ආදිය සෑම තැනම දක්නට ලැබෙන බව ද සීඝ්‍ර සංවර්ධනයක් කරන බවට පැවසූ නමුත් අද වන විට සිදු කර ඇති එකම සංවර්ධනය වන්නේ 2021-06-18 දින නාගරික සංවර්ධන අධිකාරිය හා බළන්ගොඩ නගර සභාව එක්ව සිදු කළ ඇවිදින මංතීරු ව්‍යාපෘතිය පමණක් බව ද එම කාලයේ සභාපති වශයෙන් කටයුතු කළේ තමන් වුව ද තමාගේ පින්තූරය එම ව්‍යාපෘති පුවරුවෙන් ඉවත් කර වත්මන් සභාපතිගේ පින්තූරය යොදා ඇති අතර සභාවේ පවතින තමන්ගේ පින්තූරය ඉවත් කරනා ලෙස ද තමන් සභාපති වශයෙන් සිටි බවට ලකුණක් යෙදීමට අවශ්‍ය නොවන බව ද වෙනත් අයෙක් කළ දෙයක් ඉවත් කිරීමට හෝ වැසීමට ලක් නොකරන ලෙස ද එසේ නම් නගරයට කළ සේවය වෙනුවෙන් හිටපු ගරු සභාපතිතුමාගේ පිළිරුවක් තිබිය යුතු බව ද පවසන ලදී.

එමෙන්ම සංවර්ධන කටයුතු නවත්වන ලෙස රජයේ චක්‍රලේඛයක් නිකුත් කර ඇති නමුදු එහි හිඩැසක් ප්‍රයෝජනයට ගෙන සංවර්ධනයන් සිදු කරන අතර, මෙම කටයුතු අනුමත කරන සභිකයන්ට හා නිළධාරීන් සඳහා ඉදිරියේ දී නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරන බව ද වැරදි ආකාරයෙන් සිදු කර ඇත්නම් නිසි දඬුවම් ලැබිය හැකි බව ද දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ ගරු සභාපති වශයෙන් අකිල එල්ලාවල මැතිතුමා යම් යම් සංවර්ධන ව්‍යාපෘති සිදු කර තිබුණු නමුත් බළන්ගොඩ නගරයට ලැබුණු වටිනා ව්‍යාපෘති කිහිපයක් එතුමා සමඟ පොදු ජන එක්සත් පෙරමුණ හා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මන්ත්‍රීවරුන් එක් වී වැළැක් වූ බව ද පොදු වෙළඳසැල් ගොඩනැගිල්ල, හෙළ බොජුන් හළ, වැසිකිළි පද්ධතිය හා මහජන පොළ තනි මහලට සකස් කිරීම ආදී එම ව්‍යාපෘති ඉටු කර තිබුණේ නම් අද රට මුහුණ දෙන තත්ත්වයත් සමඟ ජය ලබා ගැනීමට තිබුණු බව ද අද වියදම පස් ගුණයකින් වැඩි වී ඇති අතර, එයට හොඳම උදාහරණය වන්නේ නගර සභාවට මිල දී ගැනීමට සූදානම් වන ජෙනරේටරය බව ද ජර්මන් හෝ ඉතාලියේ නිෂ්පාදනය කරන ලද ජෙනරේටරයක් ලක්ෂ 20 ක මුදලකට මිල දී ගැනීමට ඉඩ ලබා නොදුන් නිසා අද ලක්ෂ 40 කට වැඩි මිලකට ඉන්දියන් නිෂ්පාදනයක් මිල දී ගැනීමට සිදු ව ඇති බව ද එදා සිදු කළ කඩාකප්පල්කාරී කටයුතුවල ප්‍රතිඵලය බළන්ගොඩ ජනතාවත් සභාවත් භුක්ති විඳින අතර,සභාව පැමිණි ක්‍රමවේදය හා පිළිවෙල අද නොමැති බව ද ගරු සභාපතිතුමා වටා සිටින හිත මිතුරු කණ්ඩායම සේ බොරුවට රවටන්නේ නැතිව සිදු කරන හොඳ දේ හොඳ වශයෙනුත් වැරදි දේ වැරදි වශයෙනුත් තමන් පෙන්වා දෙන අතර, සභාවේ ඉදිරි කටයුතු කරගෙන යාමේ දී නිවැරදි දේ සඳහා සහය දෙන බව පවසමින් තම අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**ප.ව 12.35 ට පමණ ගරු නාගරික මන්ත්‍රී චමික ජයමිණි විමලසේන මැතිතුමා ගරු සභාවෙන් පිටවන ලදී.**

**ගරු නාගරික මන්ත්‍රිනී තරංගනී සමරසේකර මැතිතුමිය**

ගරු නාගරික මන්ත්‍රිනී තරංගනී සමරසේකර මැතිතුමිය අදහස් දක්වමින් පසුගිය සභාවක දී වැඩ අවසන් නොකළ ව්‍යාපෘති කිහිපයක් සම්බන්ධව අදාල ලිපි යොමු කරන ලෙස යෝජනාවක් කළ අතර, එහි වත්මන් තත්ත්වය පිළිබඳව පැහැදිලි කරන ලෙස ද නන්දන කඩය අසල පාර සකස් කරන ලෙස ද ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ. ප්‍රේමකුමාර මැතිතුමාගේ නිවස ආසන්නයේ කොන්ක්‍රීට් කොටස් නොමැති වීම නිසා වාහන අනතුරු සිදු වන බැවින් ඒ සම්බන්ධව අවශ්‍ය පිළියම් යොදන ලෙස ද වැසිකිළි ආධාර ලබා දීමේ කටයුතුවල වත්මන් තත්ත්වය පැහැදිලි කරන ලෙස ද පවසන ලදී.

මේ සම්බන්ධව කරුණු පැහැදිලි කිරීම සඳහා ගරු සභාපතිතුමාගේ යෝජනාවෙන් හා ගරු උප සභාපති එම්.ටී.එම්. රුමී මැතිතුමාගේ යෝජනා ස්ථිරත්වයෙන් ගරු සභාව කාරක සභාවක් බවට පත් කරන ලදී.

අදාල කරුණු පැහැදිලි කර ගැනීමෙන් අනතුරුව ගරු සභාපතිතුමාගේ යෝජනාවෙන් හා ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමියගේ යෝජනා ස්ථිරත්වයෙන් කාරක සභාව මහ සභාව බවට පත් කරන ලදී.

**ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ. ප්‍රේමකුමාර මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ. ප්‍රේමකුමාර මැතිතුමා අදහස් දක්වමින් ගරු නාගරික මන්ත්‍රිනී තරංගනී සමරසේකර මැතිතුමිය පැවසූ වැඩ අවසන් නොවූ ව්‍යාපෘති සම්බන්ධයෙන් මාර්ග සංවර්ධන අධිකාරිය සමග සාකච්ඡා කළ අතර, එම කටයුතු අවසන් කර දෙන බවට ඔවුන් පැවසූ බව ද තමන්ගේ නිවස ආසන්නයේ වාහන ගමනාගමනයේ දී අනතුරට ලක්වන ස්ථානයේ ස්ලැබ් යෙදීමට කටයුතු කරන බව ද නන්දන කඩය අසල පාර සකස් කරන බව ද තම නිවස ආසන්නයේ ඇති ටෙලිෆෝන් කණුව ඉවත් කර නොමැති නිසා ජලය ගලා යාමේ දී ගැටලු ඇති වන බව ද පවසන ලදී.

**ගරු නාගරික මන්ත්‍රී රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා අදහස් දක්වමින් පසුගිය දා ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී අකිල සාලිය එල්ලාවල මැතිතුමා, බළන්ගොඩ ප්‍රාදේශීය සභාවේ ගරු සභාපතිතුමා හා නගර සභාවේ ගරු සභාපතිතුමාගේ නිවාස සඳහා එල්ල වූ ප්‍රහාරයන් සම්බන්ධව උසාවි නඩු කටයුත්තක් පවතින නිසා ඒ පිළිබඳව කතා නොකරන බව ද පාස්කු ප්‍රහාරය අවස්ථාවේ දී බෞද්ධ හා කතෝලික සියලුම දෙනාගේ චෝදනාව සමස්ත මුස්ලිම් ප්‍රජාව වෙතම එල්ල වූ අතර, එම කාලයේ රාත්‍රියක මුස්ලිම් පල්ලිවලට ප්‍රහාර එල්ලවන බවට ගරු නාගරික මන්ත්‍රී එම්. ජුනයිදීන් මලීක්ෂා මැතිතුමා පැවසූ අවස්ථාවේ දී තමන් පල්ලිය ආරක්ෂාව සඳහා එම ස්ථානයට ගිය බව ද බෞද්ධ දර්ශනය අදහන සැබෑ බෞද්ධයකු වශයෙන් අන්‍යාගමික පල්ලියක් වුවත් ආරක්ෂා කිරීමට තමන් කටයුතු කළ අතර, මැයි 09 වනදා දහවල් තමන් ගරු සභාපතිතුමා හට වරින් වර දුරකථන ඇමතුම් ලබා දී ආරක්ෂාකාරීව පරිස්සමින් සිටින ලෙස පැවසූ බව ද ගරු පාර්ලිමේන්තු අකිල එල්ලාවල මැතිතුමා එතුමාගේ නිවසට ප්‍රහාරයක් එල්ල වීමට ඉඩ ඇති බැවින් ඒ සම්බන්ධව බලන ලෙස පැවසීම නිසා එම දේවල් ආරක්ෂා කිරීමට ගිය බව ද සමාජයෙන් කුමක් කිව හැකි නමුත් උසාවියෙන් මේ ගැන නිවැරදි තීන්දුවක් ලබා දෙන බව ද මෙවැනි දේ නැවත ඇති නොවේවායි ප්‍රාර්ථනා කරන බව ද මෙවැනි දෙයක් නැවත ඇති වුවහොත් තමන්ට ප්‍රහාරයක් එල්ල කරන බවට ඇතැමුන් කියා සිටින බව ද පැවසීය.

එමෙන්ම අද දින සභාවට පැමිණෙන ලෙස දැනුම් නොදීම සම්බන්ධව කණගාටුව ප්‍රකාශ කරන බව ද එක්සත් ජාතික පක්ෂවලට අපව ඕන වුවත් ජනතාවට සේවය කිරීමට පක්ෂ අවශ්‍ය නොවන බව ද 2011 වර්ෂයේ දී පක්ෂයෙන් පැමිණ නාම යෝජනා දුන් අතර, ඒ වන විට හිටපු ගරු සභාපතිතුමා නගරයෙහිම එතුමාගේ පෝස්ටර් අලවා තිබුණු බව ද එම පොස්ටර් උඩින් වෙනත් අයට පෝස්ටර් ඇලවීමට නොහැකි නිසා බොහෝ දෙනා පෝස්ටර් නිවසේ තබා ගෙන සිටි නමුත් තමන් පමණක් එම පෝස්ටර් අඩක් වැහෙන පරිදි ඇල වූ බව ද තමන්ගේ පක්ෂයේ අය විසින් තමන්ගේ පෝස්ටර් වසමින් පෝස්ටර් ඇල වූ බව ද පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රී රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා වැඩිදුරටත් අදහස් දක්වමින් තමන්ගේ පක්ෂ සාමාජිකත්වය පෙන්වන ලෙස එක්සත් ජාතික පක්ෂ මහ ලේකම්වරයාගෙන් ඉල්ලා සිටින බව ද සියලුම මහජන නියෝජිතයන් පත්ව පැමිණ ඇත්තේ මහජනතාවට සේවය කිරීමට බව ද අදින් පසු මෙම මන්ත්‍රී ධූරයේ තමන් නොසිටියත් ඕලුගංතොට කොට්ඨාසයේ වැඩ කටයුතු සොයා බලා සභාවෙන් කල හැකි දේ කරන ලෙස ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමාගෙන් ඉල්ලා සිටින බව ද සභාවේ නොසිටින නමුත් අවශ්‍ය උදව් ලබා දෙන බව ද සභාවේ සිටි කාලය තුල සභිකයන්,නිලධාරීන් හා මාධ්‍යවේදීන්ගේ යම් සිත් රිදවීමක් සිදු වූයේ නම් සමාවන ලෙස ද පවසමින් තම අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**ගරු නාගරික මන්ත්‍රී කේ.ජී. පේමදාස මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී කේ.ජී. පේමදාස මැතිතුමා අදහස් දක්වමින් පසුගිය දින වැඩිහිටි බල මණ්ඩල රැස්වීමේ දී ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නිලධාරියෙකු පැමිණ වගා සංග්‍රාමය දියත් කිරීම සඳහා සමිතිවලට සහය ලබා දෙන බව පැවසූ බව ද ගවයන්ගේ ගැටලුව විසඳී නොමැති අතර තමන් විසින් මීට පෙර අවස්ථා ගණනාවක දී මේ සම්බන්ධව සභාවේ සඳහන් කළ බව ද මේ පිළිබඳව අවධානය යොමු කර ගව හිමියන් දැනුවත් කර මෙම ගැටලුව විසඳා දෙන ලෙස ඉල්ලා සිටින බව ද පවසන ලදී.

එමෙන්ම දුනුගහමඩලවත්ත මාර්ගයේ පවතින යෝගට් නිෂ්පාදිත ආයතනයෙන් ඉවතලන අපද්‍රව්‍ය ට්‍රැක්ටර් මඟින් ප්‍රවාහනය කිරීමේ දී සුළඟට පාර දෙපසට වැටෙන අතර, පාර දෙපස වල් බිහි වී ඇති බව ද නිසි කාණු පද්ධතියක් නොමැති බව ද මෙම තත්ත්වය ඩෙංගු රෝගයට රුකුලක් වී ඇති නිසා කම්කරුවන් දෙදෙනෙකු යොදවා පාර දෙපස සුද්ධ කර දෙන ලෙස ඉල්ලා සිටින බව ද පවසමින් තම අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය**

ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය අදහස් දක්වමින් කරව්කැටිය හංදිය වනතෙක් වීථි බල්බ අක්‍රිය වී ඇති බැවින් ඒ සම්බන්ධව සොයා බලා අවශ්‍ය පියවර ගන්නා ලෙස ද කාන්තාවක් වශයෙන් අද රටේ ඇති වී තිබෙන ප්‍රශ්න ගැන කතා නොකර සිටිය නොහැකි බව ද මිනිස්සු පෝලිම්වල කාලය ගත කරමින් ඉතා දුෂ්කර ජීවිතයක් ගෙවන බව ඉහළ නායකත්වයට නොපෙනෙන බව ද එදා වේල කන්න නැතිව ගෑස්, කිරිපිටි, හාල් ආදිය නොමැතිව මිනිසුන් දුක් විඳින අතර දරුවන්ට ලබා දෙන කිරිපිටිවල හෝ මිල ගණන් අඩු කර ලබා දෙන ලෙසට යෝජනා කරන බව ද කාන්තාවන් විශාල පීඩනයකට ලක්ව ඇති අතර, පසුගිය දා සභාවෙන් රු.5,000.00 ක සහන මල්ලක් ලබා දෙන බවට ප්‍රකාශ වීමත් සමඟ එය ලබා දෙන ලෙස ඉල්ලීම් විශාල ප්‍රමාණයක් ලැබෙන අතර, පවුල් 10 කට හාල් හා පිටි

පමණක් හෝ ලබා දීමට හැකි නම් හොඳ බව ද මිනිසුන්ට එක වේලක්වත් කන්න දිය නොහැකි ආණ්ඩුවක් විසින් ඔලු ගෙඩි මාරු කරමින් කරනු ලබන ක්‍රියා පිළිවෙල තේරුමක් නොමැති බව ද කෘෂිකර්මාන්තය නැති කිරීම ආණ්ඩුව කළ විශාලම වරද බව ද මෙම අර්බුදකාරී තත්ත්වය තුල ගම් මට්ටමින් හෝ කළ හැකි යමක් වේ නම් එය ඉටු කරන ලෙස ද ගරු ආණ්ඩුකාරතුමා හරහා හෝ ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී අකිල එල්ලාවල මැතිතුමා මගින් පාර්ලිමේන්තුවේ මේ සම්බන්ධව කතා කර අඩුම වශයෙන් කිරි පිටි මිල වත් අඩු කරන ලෙසට පවසන ලෙස ද සඳහන් කරමින් තම අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**ගරු නාගරික මන්ත්‍රිනී පී. චන්ද්‍රලතා මැතිතුමිය**

ගරු නාගරික මන්ත්‍රිනි පී. චන්ද්‍රලතා මැතිතුමිය අදහස් දක්වමින් ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය පැවසූ පරිදි අද වන විට කාන්තාව පීඩනයට ලක් වී ඇති බව ද පසුගිය දිනක සතොස වෙළඳසැලෙහි භාණ්ඩ හිස් වී තිබීම සහ බළන්ගොඩ හාල් හිඟය සම්බන්ධව ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී අකිල එල්ලාවල මැතිතුමාව දැනුවත් කළ අවස්ථාවේ දී එතුමා අවශ්‍ය පියවර ගනිමින් එම අඩුපාඩු සම්පූර්ණ කිරීමට කටයුතු කළ බව ද එතුමා හැකි උපරිමයෙන් සේවය ලබා දෙන බව ද පොහොර නොමැති කමින් කෘෂිකර්මාන්තය කඩා වැටුණු බවට බැන වැදීමෙන් ඵලක් නොමැති අතර, පර්චස් 5 ක හෝ 10 ක හෝ ගෙවතු වගාව ආරම්භ කර ඇති අය වෙනුවෙන් නිසි අධීක්ෂණයක් සිදු කර නගර සභා කොම්පෝස්ට් ව්‍යාපෘතියෙන් පොහොර යම් ප්‍රමාණයක් ලබා දෙන ලෙස යෝජනා කරන බව ද ඔවුන්ට අවශ්‍ය බීජ ගොවි ජන සේවා මධ්‍යස්ථානය මගින් ලබා දීමට අවශ්‍ය කටයුතු සලසා දී ඇති බව ද කර්මාන්ත කටයුතු නවත්වන ලෙස කිවුව ද යන්ත්‍ර සූත්‍ර මගින් කර ගත හැකි කටයුතු පවතින අතර, තම කොට්ඨාසයේ එගොඩ මෙගොඩ යාවෙන පාර කුඩා යන්ත්‍රයක් යොදා සකස් කර දෙන ලෙස ද කසළ ටෙන්ඩරයේ කම්කරු දීමනාව වැඩි කිරීම සඳහා ගත් තීරණය හැකි ඉක්මනින් ක්‍රියාත්මක කරන ලෙස ද රු.5,000.00 ක බඩු මලු ලබා දීමේ දී 06 දෙනෙකු තෝරා ගැනීම දුෂ්කර වී ඇති අතර, මේ සඳහා වැඩපිළිවෙලක් සකස් කරන ලෙස ද පවසමින් තම අදහස් දැක්වීම අවසන් කරන ලදී.

මෙහි දී ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා පැවසුවේ රු.5000.00 බඩු මලු බෙදා දීමේදී එක් මන්ත්‍රීවරයක්ට 06 බැගින් වන සේ මුදල් වෙන් කිරීම නිසා ඇතැම් කොට්ඨාසවලට වැඩි ප්‍රමාණයකුත් තවත් කොට්ඨාසයකට අඩු ප්‍රමාණයකුත් වශයෙන් අඩු වැඩිවීම් සිදු වන නිසා බඩු මලු බෙදා දෙන සංඛ්‍යාව කොට්ඨාස 10 ට සමාන වන සේ බෙදා දෙන්නේ නම් එම කොට්ඨාසය තුල මන්ත්‍රීවරුන්ට එය සුදුසු පරිදි වෙන් කර ගැනීමක් කර ගත හැකි බවයි.

**ගරු උප සභාපති එම්.ටී.එම්. රූමි මැතිතුමා**

ගරු උප සභාපති එම්.ටී.එම්. රූමි මැතිතුමා අදහස් දක්වමින් පසුගිය මැයි 09 වන දින ඇති වූ සිද්ධිය සඳහා ගරු නාගරික මන්ත්‍රී රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමාගේ යම් සම්බන්ධයක් පවතින බවට ආරංචියක් ලැබුණු බව ද එතුමා තමාගේ දීර්ඝකාලීන මිත්‍රයෙක් වන අතර, එකට සිටිමින් මෙවැනි කාර්යයකට සම්බන්ධ වූ බව දැන ගැනීමෙන් තමා ඉතා කණගාටුවකට හා වේදනාවකට පත් වූ බව ද දිනපතා දුරකතනයෙන් කතා කළ එතුමා සමග මෙම හේතු නිසා ඇති වූ වේදනාව නිසා තමන් කතා කිරීමට යොමු නොවුන නමුත් පසුගිය දා එතුමා මන්ත්‍රී ධූරයෙන් ඉවත් කළ බවට පැවසීමත් සමඟ දුරකතන ඇමතුමක් ලබා ගත් බව ද එහි දී එතුමා මෙම සිද්ධියට තමන් සම්බන්ධ නැති බවට දිවුරා ප්‍රකාශ කළ බව ද මේ ගැන සභාවේ යම් පැහැදිලි කිරීමක් සිදු කිරීමට අවස්ථාවක් නොලැබීම පිළිබඳ එතුමා දුක්

වූ නමුත් ගරු සභාපතිතුමා විසින් එතුමාට සභාවට පැමිණිය හැකි බව පැවසීමත් සමඟ තමන් ඒ බව දුරකතනයෙන් දැනුම් දීමෙන් අනතුරුව අද දින සභාවට සහභාගී වූ බව ද පවසන ලදී.

එමෙන්ම පසුගිය වසර 4 ක කාලය තුල කොට්ඨාසය වෙනුවෙන් විශාල සේවයක් එතුමා සිදු කළ අතර, එය අගය කරන බව ද ඉදිරියටත් ජනතාවට සේවය කිරීමට ශක්තිය ධෛර්යය ලැබේවායි ප්‍රාර්ථනා කරන බව ද තමන් නිසා යම් හිත් රිදවීමක් හෝ වූයේ නම් සමාවන ලෙස ද පවසමින් තම අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**11. අවසානය**

ගරු සභාපතිතුමා අදහස් දක්වමින් තමාගේ සිතේ වෛරයක් හෝ ක්‍රෝධයක් නොමැති බව හැසිරීමෙන් හා ක්‍රියා කලාපය අනුව පැහැදිලි වනු ඇතැයි සිතන බව ද ගරු නාගරික මන්ත්‍රී රවීන්ද්‍ර කවිරත්න මැතිතුමා අද දින සභාවට පැමිණීමට හැකිවේ යැයි නොසිතන්නට ඇති බව ද එතුමාට පැමිණෙන ලෙස දැනුම් දීමට තමාට නොහැකි වුවත් පැමිණියහොත් පිළි ගැනීමට හැකි බව ගරු සභාවේ දී දැනුවත් කළ නිසා එතුමාට සභාව ඇමතීමට අවස්ථාවක් හිමි වූ බව ද පක්ෂ සාමාජිකත්වයෙන් ඉවත් කළ ද 16 වන දින ගැසට් වන තුරු මන්ත්‍රී ධූරය ඉවත් නොවන බව ද පැවසීය.

ගරු නාගරික මන්ත්‍රී චමික ජයමිණි විමලසේන මැතිතුමා විසින් ඡායාරූප ඉවත් කිරීමක් පිළිබඳව පැවසූ අතර, එසේ ඉවත් කිරීමට තමාගේ කිසිදු අවශ්‍යතාවයක් නොතිබූ බව ද කිසියම් අයකු විසින් වැරදි වැටහීමක් ඇති කර ඇති බව ද තමන් සභාපති වශයෙන් පත්ව මාස දෙකක් යනතුරු සභාවේ සභාපතිවරයා ලෙස එතුමාගේ ඡායාරූපය පැවති අතර, ඇවිදින මංතීරු ව්‍යාපෘතිය එතුමාගේ උත්සාහයක ප්‍රතිඵලයක් නොව ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී අකිල එල්ලාවල මැතිතුමාගේ සහ ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමාගේ උත්සාහයේ ප්‍රතිඵලයක් බව ද නගරයේ පළමු පුරවැසියා ලෙස එතුමාගේ ඡායාරූපය යොදා තිබූ නමුත් එය විවෘත කරන අවස්ථාවේ සභාපති වශයෙන් කටයුතු කරන පුද්ගලයාගේ ඡායාරූපය එහි යොදන බව එතුමා තේරුම් ගත යුතු බව ද තමන් ඡායාරූප සඳහා වටිනාකමක් නොදෙන අතර දක්ම හා ප්‍රතිපත්ති පවතින්නේ තම ක්‍රියාකලාපය තුල බව ද සියලුම මන්ත්‍රීවරුන්ට මෙන්ම ජනතාවට කළ හැකි උපරිම උදව් උපකාරයන් තමන් සිදු කරන අතර, කාර්යශූර අවංක හා මුදල් සභාවට ගෙන ආ බවට එතුමා පැවසුවත් සභාපති ධූරයේ සිටින කාලය තුළ වගකීම් විරහිතව කටයුතු කර ඇති බව ද පැවසීය.

එමෙන්ම ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා කොට්ඨාස මට්ටමින් බඩු මලු බෙදා දීම සම්බන්ධයෙන් අදහස් දක් වූ අතර, තමන් සියලුදෙනාටම ඇහුම්කන් දෙන පුද්ගලයෙක් බව ද ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ. ප්‍රේමකුමාර මැතිතුමා සමඟ ද මේ සම්බන්ධව සාකච්ඡා කළ බව ද ප්‍රාදේශීය ලේකම් කාර්යාලය ඔස්සේ සියලුම දෙනා ආරක්ෂා වන පරිදි මෙම කටයුත්ත සාධාරණව සිදු කිරීමේ ක්‍රමවේදයක් සකස් කර ඇති බවද පැවසූ ගරු සභාපතිතුමා, සාමූහිකව හිත්වේදනා ඇති කර නොගනිමින් පක්ෂ භේද ජාති භේද නොසලකා සියලු දෙනා එක්ව කටයුතු කළ යුතු බව ද මෙම ආණ්ඩුවේ ගරු අග්‍රාමාත්‍යවරයා එක්සත් ජාතික පක්ෂයෙන් පත් කිරීම සුභවාදීව දැකිය යුතු අතර, මෙම රට ගොඩනැඟීමට සියලු දෙනා කටයුතු කළ යුතු බවද පවසන ලදී.

වැඩිදුරටත් අදහස් දක්වමින් ගරු සභාපතිතුමා, 1977 විවෘත ආර්ථික ක්‍රමයේ අවසාන පිපිරීම මේ වන විට සිදු වන බව ද එහි ප්‍රතිඵල සියලු දෙනා අත් විඳින අතර, තමාගේ නිවස ගිනිබත් වී අද වන විට මාසයක්

ගත වී ඇති බව ද බළන්ගොඩ සියලු ජාතීන් එක්ව සහජීවනයෙන් සිටින නගරයක් වන නමුත් ඒ සියලු දෙනා එක් වී නිවස ගිනි තැබූ බව ද නැවත සභාවක් පත්වන අවස්ථාවක දී ගරු නාගරික මන්ත්‍රී රවීන්ද්‍ර කවිරත්න මැතිතුමාට මෙම සභාවට පැමිණීමට හැකි වේවා යි ප්‍රාර්ථනා කරන බව ද පවසමින් අද දින සභාවේ කටයුතු සාර්ථක කර ගැනීමට සහභාගි වූ ගරු මන්ත්‍රී මණ්ඩලය, ලේකම්තුමා ඇතුළු කාර්ය මණ්ඩලය හා මාධ්‍යවේදීන් සියලු දෙනාට ස්තූතිය පළ කරමින් මෙදින මහ සභාවේ වැඩ කටයුතු ප.ව.1.38 ට පමණ අවසන් කරන ලදී.

ඩබ්.ඒ.වසන්ත ගුණරත්න,
සභාපති,
බළන්ගොඩ නගර සභාව.